විෂයය :- සිංහල සාහිත්‍යය

ශ්‍රේණිය :- 11

වාරය :- 2

ඒකකය :- මග විසිතුරු

ඉගෙනුම් පල :-

- නිර්දිෂ්ට සන්දේශ කවිවල කාව්‍යෝපක්‍රම හඳුනාගෙන ඉදිරිපත් කරයි.
- පද්‍ය පන්තියේ රසවත් අවස්ථා මතු කොට දක්වයි.
- නිර්දිෂ්ට සන්දේශ කවි රස විඳිමින් විචාරය කරයි.

## ක්‍රියාකාරකම i

1. කෙටි පිළිතුරු සපයන්න.

    i. ප්‍රථම සන්දේශ කාව්‍යයේ නම කුමක් ද?
    ii. එහි රචකයා කවරෙක් ද?
    iii. වලාකුළක් මාර්ගයෙන් තම ප්‍රියාවට පණිවුඩයක් යවන ආකාරයෙන් ලියූ සීගිරි ගීයෙහි රචකයාගේ නම ලියන්න.
    iv. ''කලවන් බිඟු මහත් වත හිරු හත් වත'' යන පාඨය උපුටා ගෙන තිබෙන ග්‍රන්ථයේ නම කුමක් ද?
    v. අපේ පැරණි ව්‍යාකරණ ග්‍රන්ථයේ නම ලියන්න.

2. කෝට්ටේ යුගයේ රචිත සන්දේශ කාව්‍යය පමණක් ඇතුළත් වරණය තෝරන්න.

    i. ගිරා, සැළලිහිණි, පරෙවි, සැවුල්
    ii. හංස, කැටකිරලි, මයුර, ගිරා
    iii. කොවුල්, පරෙවි, තිසර, නීලකොබෝ
    iv. පරෙවි, සැළලිහිණි, ගිරා, හංස

3. තොටගමුවේ රාහුල හිමියන් පිළිබඳ අසත්‍ය කරුණ වන්නේ

    i. භාෂා සයක් දැන සිටියේ ය.
    ii. තොටගමුවේ විජයබා පිරිවෙන්පති ය.
    iii. සිංහලයේ පළමු මහාකාව්‍යයේ රචකයා ය.
    iv. සවන සිරි පැරකුම් නිරිඳුගේ පුත් තනතුරේ වැඩුණේ ය.

4. සැළලිහිණි සන්දේශය සම්බන්ධයෙන් සත්‍යය නො වන්නේ කුමක් ද?

    i. පද්‍ය 108 කි.
    ii. සියලු පද්‍ය සමුද්‍රඝෝෂ විරිතෙන් රචිත ය.
    iii. දූතයා ශාරිකා පක්ෂියෙකි.
    iv. උලකුඩය දේවියට පුත් රුවනක් ලබා ගැනීමට යැවෙන්නකි.

5. නිවැරදි ප්‍රකාශය තෝරන්න.

i. බුදුගුණාලංකාරයේ රචකයා වෑත්තෑවේ හිමි ය.
ii. බුද්ධිප්පසාදිනී යනු මහා කාව්‍යයකි.
iii. ලෝවැඩ සඟරාවේ කතුවරයා වීදාගම මහා මෛත්‍රීය හිමි ය.
iv. ෂට්භාෂාවන්ට 'පෛශාචි' අයත් නො වේ.

## ක්‍රියාකාරකම ii

1 කෙටි පිළිතුරු සපයන්න.

වලඳින අදහසින් මෙන් සුර ගඟ අඟන
නලබල සසල දළ රළ පෙළ නුබ නැඟෙන
වෙල ළස ගැවැසි මුතු සක් පබළු බබළන
----------------------------------------------------------

i. කවියෙහි අවසාන පාදය සම්පූර්ණ කරන්න.
ii. මෙහි දක්නට ලැබෙන විශේෂ ශබ්දාලංකාරය කුමක් ද?

2.

i. සැළලිහිණියේ රචකයා තොටගමුවේ ශ්‍රී රාහුල මාහිමියන් බව කියැවෙන සැළලිහිණි සන්දේශයේ පුරාණ සන්නයේ එන කවිය ලියන්න.
ii. මේ සන්දේශයේ දූතාශීර්වාදය ලියා තිබෙන්නේ කුමන විරිතකින් ද?

3. නිල තුරඟුට නැඟෙමින් රිවි දෙව් සිරින

දුල කැරැ ඝේසත් මිණි බරණ කිරණින

i. මේ පද්‍යයෙන් වර්ණනා කෙරෙන්නේ කුමක් සිදු කොට පැමිණෙන කවරෙකු ගැන ද?
ii. උක්ත කාව්‍ය පාදයන්හි අර්ථය ලියන්න.

4. අයිරාවණ වුත් නවතන රිසින් එන

අයිරා දහස් දිලි දුනු කොත් සිපත් ගෙන

i. අයිරාවණ යනු කවරෙක් ද?
ii. දෙවෙනි පාදයේ අර්ථය ලියන්න.

5. මල් දම් සුවඳ දුම් දුන් සොඳ වරලසිනි

කල් ගිම් නිවා සැනැහෙන සිහිලස රසිනි

i. මේ පද්‍යයෙන් හෙළි කෙරෙන සමාජ තොරතුර කුමක් ද?
ii. රාහුල හිමියන් ලියූ පරිකථාවේ නම කුමක් ද?

## ක්‍රියාකාරකම iii

**පහත දැක්වෙන පද්‍ය පාඨ කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

1.
සුර රද සමන් සමගින් සුරඟන     එවර
පැහැ නඳ මදාරා පරසතු මල්     පතර
කැර පුද වඳින රැඳි මුනි සිරිපා     තඹර
සකි සඳ පෙනේ සමනොළ ගල නැගෙන හිර

i. අංකිත පදවල අර්ථය ලියන්න.
ii. මේ කවියෙන් රූපකයක් උපුටා දක්වන්න.

2.
ග නේ මිණි බැබැළි කිරණෙව්     සතපාය
ර නේ යටග සැවුලිඳු දද     ගළපාය
අනේ ලකර කළ පුර අප     නරපාය
පෙනේ දකුණැ මහසෙන් දෙව් රද     පාය

i. මුල් පාද දෙකේ අර්ථය ලියන්න.
ii. මෙහි වර්ණනා කෙරෙන දෙවොල පිහිටියේ කවර ස්ථානයක ද?

3.
නිමල් සඳ පහන් වැනි වැලි පිට     උදුළ
සුපුල් මල් යහන් ලිය මඬු ලිය ගෙ     පෙළ
එකල් කෙළන වන දෙව්ලිය දැකැ     කොමළ
ළසල් රුකෙක සැතපෙව ළපලු     සිහිල්ළ

i. වන දෙව්ලියන් ක්‍රීඩා කළ ස්ථාන මොනවා ද?
ii. පිරිසිදු වැලි තලාව බැබළුණේ කුමක් මෙන් ද?

4. ම ශ නි ල මි න් සිටි නා දොඹ නී පියල

පි ය ස ල මි න් මලගෙහි කෙළෑ රොනින'වල

ත තු ඩ ල මි න් බිඳෑ විලිකුන් මියුරු පල

ඉ සි ඹු ල මි න් යෙහි සැළ! දඹ පඳුරුවල

i. මාර්ගය නීලවර්ණ ගන්වමින් තිබූ ශාඛ මොනවා ද?
ii. අවසන් පාද දෙකේ අර්ථය ලියන්න.

5. ව න සි රි පියුම්රා බඳ රන'බරණ යුරු

ව ට පි රි සුපුල් දුනුකේ මල් මුරුත තුරු

බි ගු පි රි වැ රූ ඔලු'පුලැඹුලවල තඹුරු

හි ම ස රි සි හි ල් දිය හෙබ දැක යන් මිතුරු

i. තුන්වැනි පාදයේ අර්ථ ලියන්න.
ii. මෙහි පළමු හා දෙවන පාදයෙහි ඇතුළත් උපමාලංකාරයේ උපමානය හා උපමේය වෙන් කොට සරල බසින් ලියන්න.

## ක්‍රියාකාරකම iv

1. සැළලිහිණි සන්දේශයේ පද්‍යාවලින් හෙළිවන

i. සමාජාර්ථික තොරතුරු
ii. දේශපාලනික තොරතුරු
එක් කරුණකට උදාහරණ දෙක බැගින් දෙමින් පැහැදිලි කරන්න.

2. සැළලිහිණි කවියා අපූර්ව වස්තු වර්ණනයේ දී

i. අතිශයෝක්තියත්
ii. ස්වභාවෝක්තියත් උචිත පරිදි යොදා ගන්නා අන්දම එක් කරුණකට උදාහරණ දෙක බැගින් දෙමින් සාකච්ඡා කරන්න.

3. සංක්ෂිප්ත වුවත් සැළලිහිණි කවියාගේ වැනුම්වල පවත්නා චමත්කාරය

i. අවස්ථා හා ස්ථාන වර්ණනාවන්ගෙන් ද
ii. ස්වභාව පරිසර වර්ණනාවන්ගෙන් ද ඉස්මතු වන අන්දම එක් කරුණකට උදාහරණ දෙක බැගින් දක්වමින් විස්තර කරන්න.

4.

i. තැනට උචිත අර්ථයත්
ii. කණට මිහිරි ශබ්දයත් මතු කිරීමට සැළලිහිණි කවියා යොදා ගන්නා උපක්‍රම කවරේ දැයි එක් කරුණකට උදාහරණ දෙක බැගින් දෙමින් සාකච්ඡා කරන්න.

5. එක ම විරිතක් තුළ විවිධ රිද්ම නිපදවමින් අර්ථ ධ්වනි මතු කිරීමට සැළලිහිණි කවියා දක්වන සමත්කම කෙබඳු දැයි සුදුසු උදාහරණ සපයමින් පැහැදිලි කරන්න.

6. සැළලිහිණි කවියා පුරාණෝක්තීන්ගෙන් මෙන් ම සංස්කෘත කවි සමයෙන් ද ආභාසය ලබා තිබෙන අන්දම සුදුසු නිදසුන් දක්වමින් විස්තර කරන්න.

## පිළිතුරු

### ක්‍රියාකාරකම i

1. i. මේඝදූතය ii. මහා කවි කාලිදාස iii සිරින හිමි iv පුරාණ ගී මයූර සන්දේශනය

   v. සිදත් සඟරාව

2. - iv 3 - iii 4- ii 5- iii

### ක්‍රියාකාරකම ii

1.

   i. බල මහමුහුද එම සඳ උතුරෙන් පෙනෙන
   ii. අනුප්‍රාසය

2.

   i. කඳවුරු කුල මැඳුරු මිණි පහනෙව් සුසැදී
   නැණගුරු සබස සමය ද දැනුමෙන් වොරැදී
   රජගුරු විජයබා පිරුවන් හිමි පැහැදී
   මෙමියුරු පදැති සැළලිහිණිය අස්න යෙදී
   ii. යහ ගී විරිතෙන්

3.

   i. යාපා පටුන ජයගෙන පැමිණෙන සපුමල් කුමරු ගැන
   ii. සූර්ය දේවයන්ගේ ශෝභාවෙන් නීලවර්ණ (කාළ වර්ණ) අසුපිට නැගී මාණික්‍ය ආභරණ කාන්තියෙන් සේසත (සුදු කුඩය) දීප්තිමත් කොට

4.

   i. ශක්‍ර දේවේන්ද්‍රයාගේ හස්තියා
   ii. දිලිසෙන දහසකට අධික දුනු, කුන්තායුධ හා අසිපත් ගෙන

5.

   i. මගීන්ට විඩා නිවා ගැනීමට මඟ අසල විශ්‍රාම ශාලා (අම්බලම්) තනා තිබූ බව
   ii. මොග්ගල්ලාන පඤ්චිකා ප්‍රදීපය

### ක්‍රියාකාරකම iii

1.

   i. පැහැනද - පැහැයෙන් ආර්ද්‍ර වූ/තෙත් වූ
   ii. සකි සඳ - උතුම් මිත්‍රය

2.

i. සූර්යයාගේ රශ්මිය මෙන් ගණ මාණික්‍යයෙන් බැබළි රන් යෂ්ටි මුදුනේ කුකුළු රූප සහිත කොඩි බැඳ
ii. පැරකුම්බා රජුගේ මාළිගාවට දකුණු පසැ

3.

i. මනාව පිපුණු මල් යහන්, ලතා මණ්ඩප හා ලතා ගෘහවල
ii. පිරිසිදු සඳ එළිය මෙන්

4.

i. නා, දඹ, බක්මී හා මොර
ii. සැළලිහිණිය, නුඹේ හොටයෙන් ඇණ ඉදුණු මිහිරි ගෙඩි භුක්ති විඳ දඹ පඳුරුවල විශ්‍රාම ගනිමින් ගමන් කරන්න.

5.

i. ඕලු, උපුල්, සුදු නෙළුම් හා රතු නෙළුම්වල මී මැස්සන් පිරිවරා සිටින
ii. උපමානය - වනය නමැති ශ්‍රියාකාන්තාවගේ පද්මරාග මාණික්‍යයෙන් යුත් ස්වර්ණාභරණය

උපමේය - වටේට තිබුණු මනාව පිපුණු දුනුකේ හා මල් පිපුණු මුරුත ගස් පෙළ

## ක්‍රියාකාරකම iv

1. (අ) සාමාජාර්ථික තොරතුරු -

- '' ගණේ මිණි බැබළි කිරණෙව් සතපා ය '' යන පද්‍යයෙන් සමකාලීන ආගමික විශ්වාස අතර දේව විශ්වාසයන් මුල් බැස තිබූ බව කියැ වෙයි.
- ''මල් දම් සුවඳ දුම් දුන් සොඳ වරලසිනි '' යන පද්‍යයෙන් මග අසල මගීන්ට ගිමන් නිවා ගැනීමට අම්බලම් තනා තිබූ බව කියැවෙයි ''කස්තුරි තිලක සැදි නළලත සුමුවාන'' යන පද්‍යයයෙන් යන එන අයට විහිළු කරමින් හැසිරුණු විනෝදකාමීන් පිරිසක් ගැවසුණු පෙදෙසක් ගැන කියැවෙයි.
- ''සන් නත් සිහින් ගෙඳි සෙවණලු වැලි තෙලෙන'' පද්‍යයෙන් කෙත්වතු සාරවත් පැසී තිබුණු බවට ඉඟි කෙරෙයි. රටේ එවකට පැවැති සමෘද්ධිමත් භාවය රන්වන් කරල් ගැන කීම මගින් හෙළි කෙරෙයි.

(ආ) දේශපාලනික තොරතුරු-

- ''නිල තුරඟුට නැගෙමින් රිවි දෙව් සිරින'' යන පද්‍යයෙන් උතුරේ බලය තහවුරු කරගෙන සිටි ආර්ය චක්‍රවර්තීගේ බලය මැඩ පැමිණි සපුමල් කුමරු ගැන කියැවෙයි.
- ''අයිරාවණ වුවත් නවතන රිසින් එන'' කයිකාවල නම් ස්ථානයේ තිබූ ප්‍රසිද්ධ මුර කපොල්ලක් පිළිබඳ ව මෙම පද්‍යයෙන් කියැවෙයි.

2. (අ) අතිශයෝක්තිය - උපමා රූපකාදී කාව්‍යාලංකාර යොදා ගෙන සිදු කරන වැනුම් අතිශයෝක්ති වර්ණනා ය. ''වලඳින අදහසින් මෙන් සුර ගඟ අඟන'' ''ව න සි රි පියුම්රා බඳ රන්'බරණ යුරු'' '' නිමල් සඳ පහන් වැනි වැලි පිට උදුල'' වැනි පද්‍ය මේ සඳහා සුදුසු ය.

(ආ) ස්වභාවෝක්තිය - යම් වස්තුවක, පරිසරයක පවත්නා ස්වරූපය අව්‍යාජ ලෙස ඉදිරිපත් කිරීම

''අග පිපි මල් මලිගිය ලිය කැලේය'' ''රිවි තැවුලේ පිපි කමලේ විල් ගැවසී'' වැනි පද්‍යය මේ සඳහා සුදුසු නිදසුන් වෙයි.

3. (අ) අවස්ථා හා ස්ථාන වර්ණනා සඳහා

''නිල තුරඟුට නැගෙමින් රිවි දෙව් සිරින'' මේ පද්‍යය මාර්ගයෙන් ජයග්‍රාහී සපුමල් කුමාරයාගේ සම්ප්‍රාප්ති අවස්ථාව අපූරුවට වර්ණනා කරයි. ''වලඳින අදහසින් මෙන් සුර ගඟ අඟන'' යන පද්‍යය මාර්ගයෙන් මහ මුහුද පිළිබඳ සිදු කරන වැනුම සංක්ෂිප්ත වුවත් චමත්කාරයෙන් අනූනය.

(ආ) ස්වභාව පරිසර වර්ණනාවන්ට නිදසුන් ලෙස ''ව න සි රි පියුම්රා බඳ රන්'බරණ යුරු'' '' නිමල් සඳ පහන් වැනි වැලි පිට උදුල'' වැනි පද්‍ය උචිත ය. සැළලිහිණි කවියා ඕනෑම වැනුමක් පද්‍යයකට දෙකකට සීමා කරයි. එහෙත් ඒවා රසයෙන් කිසි අඩුවක් නැති බව පැහැදිලි කළ යුතු ය.

4. (අ) තැනට උචිත අර්ථය යන්නෙන් කාව්‍යාලංකාර මගින් අදහස් රසවත් ඉදිරිපත් කොට ඇති පද්‍ය අපේක්ෂා කෙරේ. ''වලඳින අදහසින් මෙන් සුර ගඟ අඟන'' ''ව න සි රි පියුම්රා බඳ රන්'බරණ යුරු'' '' නිමල් සඳ පහන් වැනි වැලි පිට උදුල'' වැනි පද්‍ය මේ සඳහා නිදසුන් ලෙස යොදා ගත යුතු ය.

(ආ) කණට මිහිරි ශබ්ද යනු අනුප්‍රාසය එළිසමය වැනි ශබ්දාලංකාර ප්‍රයෝග භාවිත කොට ධ්වනිතාර්ථ නංවන අවස්ථායි. ''නල බල සසල දළ රළ පෙළ නුබ නැගෙන'' ''සන් නන් සිහින් ගෙඳි සෙවණලු වැලි තෙලෙන'' වැනි පද්‍යවල භාවිත අනුප්‍රාසාත්මක ශබ්ද සංයෝජනය හා එළිසමය එළිවැට යන ප්‍රයෝග ගැන සුදුසු නිදසුන් මාර්ගයෙන් සාකච්ඡා කළ යුතු ය.

5. සමුදුරු රළ වෙරළ කරා ඇදී විත් බිඳී විසිරී යන අන්දම ''නල බල සසල දළ රළ පෙළ නුබ නැගෙන'' යන පද්‍ය පාදයේ ශබ්ද සංයෝගයත්, මාත්‍රා භාවිතයත් අක්ෂර ගැළපීමත් මගින් මනාව නිරූපණය කොට තිබේ. සමුදුර වස්තු කර ගත් වර්ණනාවකට සුමුදුරු ගොස් විරිත යොදා ගෙන තිබීම ද අසිරිමත් කාරණයකි. ''සන් නන් සිහින් ගෙඳි සෙවණලු වැලි තෙලෙන'' යන පද්‍යයේ පාදවල ආරම්භයේ යොදන සන් නන් තැන් තැන් රන් වන් යන් මන් යන පද පෙළෙහි රිද්මය මගින් සැළලිහිණියා බිමට බැස තැනින් තැනට පැන හොටයෙන් ධාන්‍ය ඇට ආදිය අහුලා කන ආකාරය නිරූපණය වෙයි. ''රිවි තැවුලේ පිපි කමලේ'' පද්‍යයෙහි ද පවත්නේ සැළලිහිණියා සතුටින් ඉතා සැහැල්ලුවෙන් පියාඹා ගෙන යන ආකරය ධ්වනිත කරන රිද්මයකි.

6. පුරාණෝක්ති ඇසුරු කර ගත් පද්‍ය ලෙස ''සුර රද සමන් සමගින් සුරඟන එවර'' ''ගණේ මිණි බැබළි කිරණෙව් සතපාය'' '' අයිරාවණ වුවත් නවතන රිසින් එන'' යන පද්‍ය සැලකිය හැකි ය. සංස්කෘත කවි සමය ඇසුරු කර ගත් නිර්මාණ ලෙස ''වලඳින අදහසින් මෙන් සුර ගඟ අඟන'' ''නිල තුරඟුට නැගෙමින් රිවි දෙව් සිරින'' යන පද්‍ය ගත හැකි ය. අහස් ගඟ ප්‍රියාව ලෙසත් සමුද්‍රය ඇයගේ ස්වාමියා ලෙසත් සකු කවි සමයේ දැක් වෙයි. සූර්ය දිව්‍යරාජය නීලවර්ණ අසකු පිට නැග යෑම යනු ද සකු කවි සමයාගත සංකල්පයකි.